# 2020 නව විෂය නිර්දේශයට අනුකූලව සකස් කරන ලද

# 5 ශිෂ්‍යත්ව පෙරහුරු ප්‍රශ්න පත්‍ර

❖අංක 2    ii පත්‍රය    කාලය පැය 1 යි මිනිත්තු 15

(1) ඡේදය ඇසුරින් පිළිතුරු ලියන්න

අඳුනන කෙනෙකු හෝ නෑයෙකු එනවා දුටුවොත් කවදාවත් අහක බලාගෙන නොයනු. ඔවුනට සුදුසු විදියෙන් ආචාර කිරීම ඉතා හොඳ ගතියකි .එය ශීලාචාර ළමයින් ඇඳින ගන්නා ලක්ෂණයෙකි . ගුරුවරයා ඇත යනවා දුටුවොත් බිම හෝ අහක හෝ බලාගෙන නොයන්න .එසේ කිරීම ඉතා අශෝභනය .

i) ප්‍රාණවාචී ඒකවචන පුරුෂලිංග උක්ත පදයක් ලියන්න........................................

ii) ප්‍රාණවාචී බහුවචන අනුක්ත පදයක් ලියන්න....................................................

iii) විරුද්ධ පද දෙකක් ඉහත කොටසෙන් ම තෝරා ලියන්න

...................................................................

iv) මූර්ධජ අකුරු ඇතුළත් වචනයක් තෝරා ලියන්න..............................................

v) නෑයෙකු යන පදයෙහි ඇතුළත් පිල්ලම් හඳුන්වන්න.......................................

(ල. 10)

(2)පහත අවස්ථාවන් සඳහා සුදුසු ප්‍රස්තාව පිරුළු ලියන්න.

i) විමසීමකින් තොරව කටයුතු කිරීම..................................................................

ii) අනුන් රවටන්නට ගොස් තමන් රැවටීම................................................

(ල. 04)

(3)පහත වැකි බහුවචනයට හරවා ලියන්න

i)ගෙවිලිය කුඹුරට ඇඹුල ගෙන යයි...................................................................

ii) ක්‍රීඩකයා හොඳින්  ක්‍රීඩා කළේය.......................................................................

(ල. 04)

(4) පහත වචනවල හිස්තැනට සුදුසු අකුර තෝරා යටින් ඉරක් අඳින්න

i) ප්‍රදර්ශ......ය (ණ/න)

ii) සමීක්ෂ...... (ණ/න)

iii) සාධාර...... (ණ/න)

iv)ව්‍යස.....ය (ණ/න) (ල. 04)

(5) පහත වැකි වල සුදුසු විරාම ලකුණු යොදා සම්පූර්ණ කරන්න

- i ) මැදැගිල්ල තමයි ලොක්කා නංගී උත්තර දුන්නා

  ii)ඇයගේ කැපවීම පුදුමාකාර ය

(ල. 04)

(6 )පහත දෙමළ වචනවල අර්ථය සිංහලෙන් ලියන්න

i) ඉංගේ ......................................................................................................

ii) ඉල්ලෛ ......................................................................................................

(ල. 02)

(7) පහත සිංහල වැකි සඳහා යෙදෙන දෙමළ වචනය ලියන්න

i) පොළ කොහේද?..........................................................................

ii) බත් කන්න..........................................................................................

(ල. 02)

(8) දී ඇති පින්තූරයට අදාළ ඉංග්‍රීසි වචනය ඉංග්‍රීසි අකුරෙන්ම ලියන්න



i)-------



ii)--------------(ල. 02)

(9) පහත වගන්තියේ අදහස සිංහලෙන් ලියන්න

i) Be careful..........................................................................................

ii) Don’t waste time...........................................................................

(ල. 02)

(10) **ගොඩබිම වෙසෙන ලොකුම සතා අලියා** යන මාතෘකාව යටතේ වැකි 3ක් ලියන්න

---

---

---

(ල. 06)

**(11) සිට (19) දක්වා ප්‍රශ්න වලට පිළිතුරු ලියන්න.**

(11) රටාව අනුව හිස්තැන් පුරවන්න.

i)5 080 , 5 060 , 5 040-.........................................................................................

ii) ආරෝහණයෙන් ලියන්න 59275 , 95 572 , 95 275 ..........................................

(12) එක්තරා සාප්පුවක මාසයක් තුළ විකුණූ ඇඳුම් පහත වගුවේ දැක්වේ. ඒ අනුව අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.

| වර්ගය | විකුණූ ප්‍රමාණය |
|---|---|
| කමිස | 1475 |
| ගවුම් | 650 |
| කලිසම් | 1690 |

i) එම මස විකුණූ ගවුම් හා කලිසම් ප්‍රමාණය කොපමණද?.................................

ii) කලිසම් වලට වඩා කමිස විකුණූ ප්‍රමාණය කොතරම් අඩුද?...............................

(13) ළමයෙකුට 6 බැගින් දීමට පොත් 884 ක් ගෙනෙන ලදි .

i)ළමුන් කී දෙනෙක්සඳහා එම පොත් සමානව දිය හැකිද?.......................................

ii) එසේ බෙදා දුන් පසු කොපමණ ප්‍රමාණයක් ඉතිරිවේද?......................................

(14) i) පෙ .ව .3 .30 සම්මත ආකාරයට ලියන්න .........................................

ii)ප.ව.8.25 ට මිනිත්තු 30 ට පසු වේලාව සාමාන්‍ය ආකාරයට ලියන්න..........................................................................................

(15)i)උදෑසන හිරු දෙස බලා සිටින සුමල්ගේ වමත පිහිටි දිශාව කුමක්ද?.........................................................................................

i i) උතුර හා නැගෙනහිර දිශාව අතර පිහිටි දිශාවට ගමන් කරන අයෙක් පිටුපා සිටින්නේ කුමන දිශාවටද? ...................................................................

(16) i) බඳුනක ධාරිතාව පීරිසි කෝප්ප 12 කි. පීරිසි කෝප්පයක ධාරිතාව 200 ml වේ නම් බඳුනේ ධාරිතාව කොපමණද?...........................................

ii) පොල්තෙල්15 l 500 ml තිබූ බැරලයකින් 6 l 750 ml විකුණුවේ නම් එහි ඉතිරි වූ පොල්තෙල් ප්‍රමාණය කොපමණද?..............................................

(17) රුපියල් 23 .75 බැගින් සබන්කැට 2 හා රුපියල් 38.00 ක දන්තාලේපයක්

මිලට ගෙන රුපියල් 100 ක් දුන්නේ නම් ඉතිරිවන මුදල කීයද? ..........................

(18) 67 km 500m දුර ගමනක් යාමට පිටත්වූ වාහනයක් 43 km 750m ගොස් තේ පානය සඳහා නතර කළේ නම් තව කොපමණ දුරක් යාමට තිබේද?.........................................................................................

(19) 18 kg 500g බර මාළුවෙකුගෙන් 6 kg 900g කපා ඉවත් කළේ නම් ඉතිරි කොපමණද? ..................................................................

**.(සෑම නිවැරදි පිළිතුරක් සඳහාම ලකුණු 2 බැගින් ලබා දෙන්න)2x15=30**

පහත (20) සිට (49) දක්වා දී ඇති පිළිතුරු අතරින් නිවැරදි පිළිතුර **තෝරා යටින් ඉරක් අඳින්න.**

(20) සිත් පහන් කිරීමේ ක්‍රියාකාරකමේ මුල්ම පියවර වන්නේ

i මානසික ලිහිල් බව ii ශාරීරික ලිහිල් බව iii ප්‍රාර්ථනාව

(21) උපදේශාත්මක කාව්‍ය ඇතුළත් ග්‍රන්ථයක් නොවන්නේ

i සුභාෂිතය ii ලෝවැඩ සඟරාව iii හංස සංදේශය

(22) ජාත්‍යන්තර තරගයකදී අපේ අනන්‍යතාව පෙන්නුම් කළ හැකි සංකේතයකි

i බෞද්ධ කොඩිය ii ජාතික කොඩිය iii පාසල් කොඩිය

(23)මඟුල් පෝරු පිරිත් මණ්ඩප තොරණ ආදිය ඉදිකිරීමේදී භාවිතයට නොගන්නා ශාකයකි . iකොස් iiපොල් iiiකෙසෙල්

(24) අපි දිනපතා පිරිසිදු කරගත යුතු දෙයකි.

i පිඟාන iiකොට්ට උරය iiiතුවාය

(25)අප පරිහරණය කරන සපත්තුවක අඩිය ගෙවෙන ආකාරය වෙනස්වන්නේ

i කකුලේ හැඩය අනුවය ii සපත්තුවේ හැඩය අනුවය

iiiපාදය තබන ආකාරය අනුවය

(26)භාණ්ඩ ඇසුරුමක දැකිය හැකි ප්‍රමිති සහතිකයක් නොවේ

i) SLS ii) SPS iii) ISO

(27)පෝෂ්‍යදායී ආහාර වේලකින් අප අපේක්ෂා නොකරන දෙයකි

iබඩගිනි නිවීම ii ශරීර වර්ධනය වීම iiiශක්තිය ලැබීම

(28)උණුකරගත් පානයක් අයෙකුට පිළිගැන්විය යුත්තේ

i පිරිසිදු වීදුරුවක ය ii අඬුව රහිත කෝප්පයක ය iiiඅඬුව සහිත කෝප්පයකය

(29)අපිරිසිදු ආහාර ගැනීමෙන් ඇතිවිය නොහැකි රෝගයකි

i උදරාබාධ ii ඇදුම iii වමනය

(30) විසිතුරු මැහුම් ක්‍රමයක් නොවේ

i බ්ලැන්කට් මැස්ම ii නූල් දුවවීම iiiදම්වැල් මැස්ම

(31) ගංවතුර තත්ත්ව ඇතිවීම කෙරෙහි බලපාන සාධකයක් නොවේ

iවැලි ගොඩ දැමීම iiපහත් බිම් ගොඩ කිරීම iiiවන වගා වැඩි කිරීම

(32) වැඩ පහසු කිරීමේ යන්ත්‍රයට අදාළව එය ක්‍රියා කරවන ආකාරය නිවැරදිව දක්වන පිළිතුර වන්නේ

i පින්සල-ලිවීම ii පොරොව -හෑරීම iiiඋදැල්ල- කෙටීම

(33) ශ්‍රී ලංකාවේ පළමු වැනි අගමැතිතුමා වන්නේ

i ඩී.එස්.සේනානායක මැතිතුමා ii සී. ඩබ්. ඩබ්. කන්නන්ගර මැතිතුමා

iii විලියම් ගොපල්ලව මැතිතුමා

(34) වගාවට සිටින පාංශු ජීවීන් විනාශ වීමට බලපාන හේතුවක් නොවේ

i රසායනික පොහොර භාවිතය                    iiකෘමිනාශක භාවිතය

iii කැප්පෙටියා කොළ භාවිතය

(35) ආහාර ගැනීමේදී අප වැඩි වශයෙන් හුරු විය යුත්තේ

i සීනි බහුල ආහාර ගැනීමට                    iiතෙල් අධික ආහාර ගැනීමට

iiiවිටමින් බහුල ආහාර ගැනීමට

(36)අයිස් කැට දිය නොවී වැඩි වේලාවක් තබා ගැනීමට අප කළ යුත්තේ i iiප්ලාස්ටික් බෝතලයක දමා වසා තැබීම iරිජිෆෝම් පෙට්ටියක දමා වසා තැබීම iiiවීදුරු බෝතලයක දමා තැබීම

(37)දූෂිත ජලය පරිහරණයෙන් අපට වැළඳිය හැකි රෝගයක් නොවේ

iකොළරාව                    iiසෙංගමාලය                    iiiහෘද රෝග

(38)ජලරෝදයක ක්‍රියාකාරීත්වය වැඩි කර ගැන්මට කළ යුතු දෙයකි

iජල පහරේ වේගය වැඩි කිරීම                    iiජල පහරේ වේගය අඩු කිරීම

iiiජල රෝදයේ පෙති ගණන අඩු කිරීම

(39) දිය හොල්මන යනු

iළමුන් බය කරන උපකරණයකි                    iiසතුන් බය කිරීමට හේනේ තබන දෙයකි
iii සතුන් බය කිරීමට වක්කඩේ තබන ඇටවුමකි

(40)පොදු ප්‍රවාහන සේවාවලින් ලැබිය හැකි වාසි පිළිබඳ වැරදි මතයකි

i අඩු වියදමකින් යා හැකි වීම                    iiවැඩි දෙනෙකුට ගමන් කළ හැකි වීම

iii තමාට අවශ්‍ය තැනදී වාහනයෙන් බැසීමට හෝ නැගීමට හැකි වීම

(41) සුළං දිශා දර්ශකයක ඊ හිස යොමු වී ඇත්තේ

i සුළං හමා එන දිශාවටය    ii සුළං හමා යන දිශාවටය    iiiඋතුරු දිශාවටය

(42)සිදුරු කිහිපයකින් යුත් ලී පුවරුවක් යොදා ගනිමින් කරන ක්‍රීඩාවකි

i දාම් ඇදීම                    ii ඔලිඳ කෙළිය                    iii කැරම් ගැසීමය

(43) ඇස් මගින් පමණක් තොරතුරු ලබාගත හැකි මාධ්‍යයකි

i පරිගණකය                    iiජංගම දුරකථනය                    iii පුවත්පත

(44) පාසල් සිසුවෙකු ලෙස අපට කළ නොහැකි වෙනස්කමකි

i ඉවතලන කසල අදාළ බඳුන්වලට ම දැමීම

ii බුදුමැදුර අවට මල් පැළ සිටවීම

iii බුදුමැදුර ඉදිරිපස අලංකාර තොරණක් ඉදිකිරීම

(45) ඓතිහාසික ස්ථාන සංරක්ෂණය සම්බන්ධයෙන් නිවැරදි ප්‍රකාශය වන්නේ

iඅප ගෙන යන දෑ එම ස්ථානයේ තබා. යා යුතුය iiකුරුටු ගෑමෙන් මතක සටහනක් තබා ආ යුතුය iiiඑහි ඇති දෑ අත පත ගෑමෙන් වැළකී සිටිය යුතුය

(46)ආචාර්ය සී .ඩබ් .ඩබ්. කන්නන්ගර මහතා විසින් කරන ලද අධ්‍යාපන ප්‍රතිසංස්කරණයක් නොවේ

i පොදු විෂය නිර්දේශයක් සකස් කිරීම

ii පළමු වසරේ සිටම ඉංග්‍රීසි අධ්‍යාපනයක් ලබාදීම අනිවාර්ය කිරීම

iii සෑම ළමයෙකුටම තම දෙමව්පියන්ගේ ආගම ඉගැන්වීම

(47) චන්ද්‍රිකා උපයෝගී කරගනිමින් පෘථිවිය භූවමාරු ක්‍රමයක් නිර්මාණය කළ හැකි බව මුල් වරට ප්‍රකාශ කරන ලද්දේ i ආචාර්ය ටී. බී. ජයා මහතා ය iiආතර් සී. ක්ලාක් මහතා ය iiiආනන්ද කුමාරස්වාමි මහතා ය

(48)පහත ප්‍රකාශ අතරින් වැරදි ප්‍රකාශය කුමක්ද?

i අප රට පළාත් හා දිස්ත්‍රික්ක වලට බෙදා ඇත

ii පළාත් කිහිපයක් එකතු කිරීමෙන් දිස්ත්‍රික්කයක් පිහිටුවා ඇත

iii දිස්ත්‍රික්ක කිහිපයක් එකතු කිරීමෙන් පළාත් පිහිටුවා ඇත



(49රූපයේ දැක්වෙන මල වන්නේ

i නා මල ය iiමානෙල් මල ය iiiසල් මල ය

**(20) සිට (49)දක්වා නිවැරදි පිළිතුරකට1 බැගින් 1x30= 30**

ප්‍රශ්න පත්‍ර සැකසීම : සන්ධ්‍යා සමරසිංහ මිය

අනුලා විද්‍යාලය,නුගේගොඩ